# රත්නපුර ප්‍රාදේශීය සභාව
# රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 11 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, රත්නපුර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වු මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ඉකුත් වර්ෂ වලට අදාලව මුද්දර ගාස්තු රු. 8,222,392 ක් ලැබී තිබූ අතර, එම ගිණුමේ ආරම්භක ශේෂය ලෙස රු. 6,917,491 ක් පමණක් දක්වා තිබුණි. රු. 1,304,901 ක් වූ ඉකුත් වර්ෂ වලට අදාල මුද්දර ගාස්තු, එම ගිණුම හර කර සමුච්චිත අරමුදලට බැර කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) වැටුප් ප්‍රතිපූර්ණ ලේඛණය අනුව සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරිම් අගය රු. 8,014,349 ක් වුවද ලෙජර් ගිණුමේ රු. 6,822,571 ක් ලෙස දැක්වීම හේතුවෙන් එම අගයෙහි රු. 1,191,778 ක වෙනසක් නිරික්ෂණය විය.

(ඇ) වර්ෂයේ තේ දළු බිල් කිරීම් රු. 398,768 ක් විය යුතු වුවද, එම ලෙජර් ගිණුම අනුව රු. 413,078 ක් දක්වා තිබීම හේතුවෙන් බිල් කිරීම් වල රු. 14 ,310 ක වෙනසක් නිරික්ෂණය විය.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල් පොතේ ශේෂය රු. 6,590,678 ක් වුවද , මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු. 6,947,215 ක් ලෙස දක්වා තිබූ නිසා එම ශේෂයෙහි රු. 356,537 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) ගිණුම් විෂයයන් 05 කට අදාලව ලෙජර් ගිණුම අනුව ශේෂය සහ උපයෝගී ලේඛණ අනුව ශේෂය සංසන්දනය කිරීමේදී පිළිවෙලින් ආදායම් විෂයයන් තුනක් සහ වගකීම් ගිණුම් විෂයයන් දෙකක් සම්බන්ධයෙන් රු. 12,942,884 ක් සහ රු. 3,940,751 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඊ) සභාපතිවරයා විසින් ලබා ගන්නා ලද රු. 200,000ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් යටතේ ගිණුම්ගත කිරිම නිසා ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ඉදිකිරීම් කොන්ත්‍රාත් 04 ක් සඳහා ගෙවා තිබූ රු. 263,848 ක අත්තිකාරම් මුදල් ණයහිමියන් යටතේ ගිණුම්ගත කිරිම නිසා ණයහිමි ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,192,314 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,207,258 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) | වරිපනම් හා බදු | - | 24 | 27 |
| (ii.) | බලපත්‍ර ගාස්තු | - | 4,45 | - |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i.) | උසාවි දඩ | 6,257,250 |
| (ii.) | මුද්දර ගාස්තු | 12,949,534 |

2.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ජංගම ගිණුමේ දක්වා ඇති රු. 73,977 ක හර ශේෂය වර්ෂ පහකට වැඩි කාලයක සිට පැවත එන අක්‍රීය ගිණුම් ශේෂයක් බව නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. 64,963 ක් වටිනාකමැති ගිණුම් ශේෂයන් 04 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) 2012 මැයි මස 24 දින රු. 247,000 ක් වැය කර ප්‍රීමික්ස් ව්‍යාපෘතිය සඳහා වැලි කියුබ් 26 ක් මිලදී ගෙන තිබූ නමුත්, විගණිත දිනය වූ 2013 සැප්තැම්බර් මස 10 වන දින වන විටත් වර්ෂයකුත් මාස තුනක කාලයක් ගත වී ඇතත් එම තොගය සභා භූමියේ නිෂ්කාර්යයව පැවතුණි.

2.4 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සබරගමුව පළාත් සභා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ 2010 නොවැම්බර් 16 දිනැති අංක 01/2010 චක්‍රලේඛය ප්‍රකාරව පළාත් පාලන ආයතනයන්හි සේවක පුරප්පාඩු සියල්ලම පාහේ සම්පූර්ණ කර ඇති බැවින් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව කිසිඳු බඳවා ගැනීමක් සිදු නොකල යුතු අතර, සභා අරමුදලින් දීමනාවක් ගෙවීමට පුරප්පාඩු වූ තනතුරකට සේවා ගිවිසුම් මඟින් බඳවා ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, කිසිඳු අනුමැතියකින් තොරව පුද්ගලයන් 10 ක් සේවා ගිවිසුම් මඟින් බඳවා ගෙන වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 1,032,454 ක වියදමක් දරා තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව 2012 ජනවාරි 05 වන දින හා 2012 පෙබරවාරි 28 වන දින සභා තීරණ අනුව එකතුව රු. 18,000 ක මුදලක් පුණ්‍ය හා සුභසාධන ආධාර සඳහා වියදම් දරා තිබූ අතර 2012 දෙසැම්බර් 31 දින රු. 1,450,500 ක වියදමින් ටකරන් මඩු 15 ක් මිලදී ගෙන පුණ්‍ය හා සුභසාධන ආයතන වලට බෙදා දී තිබුණි.

(ඇ) 2002 අප්‍රේල් 30 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක ප.පා.කො.ඒ./03/ (1) ලිපියේ දක්වා ඇති පරිදි හියුම් පයිප්ප මිලදී ගැනිමේ දී බලවින්න කොන්ක්‍රීට් කම්හල මඟින් සිදුකල යුතු වුවද, ඒ පිළිබඳව නොසලකා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරිමකින් හෝ තොරව

පෞද්ගලික ආයතනයක් මඟින් රු. 577,500 කට හියුම් පයිප්ප 2012 පෙබරවාරි 27 දින මිලදී ගෙන තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 12 කට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා සලසා ගෙන තිබූ එකතුව රු. 1,110,000 ක් වූ ප්‍රතිපාදන වලින් කිසිම වියදමක් දරා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සලසා ගෙන තිබූ ප්‍රතිපාදනයන් ඉතිරි වූ අවස්ථා 35 ක් පමණ දක්නට ලැබූ අතර, එම වටිනාකම රු. 6,897,508 ක් පමණ බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.331,390 ක වියදමින් මිලදී ගෙන තිබූ වීථි ලාම්පු කට්ටල 150 ක් තොග ලේඛන වල සටහන් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 371 ප්‍රකාරව රු. 60,048 ක් වටිනාකමැති අත්තිකාරම් 2013 සැප්තැම්බර් මස 10 වන දින විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි V වන උපලේඛනය ප්‍රකාරව දුරකථන කුළුණු ගාස්තු අය කිරීමට පියවර ගෙන නොතිබුණි.

03. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අය වැය පාලනය

(ඇ) මූල්‍ය පාලනය

(ඈ) ආදායම් පාලනය